# සූර්ය බලයෙන් ධාන්‍ය සකසමු.

සූර්ය බලශක්තිය උපයෝගී කර ගෙන ක්‍රියාත්මක කෙරෙන සරල ධාන්‍ය බදින යන්ත්‍රයක් මිල අඩු අමු ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිර්මාණය කර ඇත. මෙය කෝපි රටකජු, කජු සහ වෙනත් ධාන්‍ය වර්ග බැද ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

බදින ද්‍රව්‍ය දැමීම සඳහා මි. මී. 150 ක උස, මි. මී. 145 ක විෂ්කම්භයකින් යුත් ටින් එකක් හෝ බැරලයක් ඇත. තුඩක් මත සවි කර ඇති බැවින් බැරලය භ්‍රමණය වේ. ඒ හේතුකොට ගෙන ද්‍රව්‍ය හොඳින් කවලම්වීමෙන් ඒකාකාරව බැද ගත හැකිය.

ටින්එකේ හෝ බැරලයේ සිලින්ඩරයේ කලු තීන්ත ආලේපකර ඇත. ඇලුමිනියම් ෂීට්වලින් නිම කළ වක්‍ර පරාවර්තකයක් (Curvedreflector) ටින් එක යටින් සවි කර ඇත.

ටින් එකේ කේන්ද්‍රයේ සිට පරාවර්තකයට ඇති දුර ප්‍රමාණය ටින් එකේ විෂ්කම්භය මෙන් දෙගුණයකට වැඩිවිය යුතුය. එහි පියන මත තව් කිහිපයක් විද තිබීම නිසා තෙතමනය පිටවේ.

හොඳින් අව් රශ්මිය ඇති දිනක දී මෙම බදින යන්ත්‍රයෙන් පැයක හෝ දෙකක කාලයක් තුළ රටකජු ග්‍රෑම් 500 ක් පමණ බැද ගත හැකි බව මූලික පරීක්ෂණවලින් සෙනීගොස් ඇත.

මෙම උපකරණය වෙනුවෙන් රු. 180/- සිට 200/- දක්වාවූ මුදලක් වැයවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙය නඩත්තු කිරීම අවශ්‍ය නැත. එමෙන්ම ඉන්ධන පිරිමසයි.

කෙසේ වෙතත්, මෙම බදින යන්ත්‍රය පාවිච්චි කළහැකි වනුයේ අනුපූරක යන්ත්‍රයක් වශයෙන් පමණී. මෙය අත්හද බැලීමේ මුල් යුගයේ පසුවන යන්ත්‍රයක් වන හෙයින්, දැනට භාවිත කළ හැක්කේ ඉතා හොඳින් හිරු රශ්මිය ඇති දිනයන්හි පමණී. එහෙයින් සෑමවිටම සාම්ප්‍රදායික බදින යන්ත්‍රයක්ද කබා ගැන්ම නුවණට හුරුවේ.